**සීමාසහිත ලංකා පොහොර සමාගම - 2016/2017 වර්ෂය**

-----------------------------------------------------------

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම

--------------------

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ජර්මන් සමූහාණ්ඩුවේ මූල්‍ය හා තාක්ෂණික දායකත්වය සහිතව සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරන රජයට පවරාගත් ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුකූලව 1992 සැප්තැම්බර් 15 දින සිට බල පැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් නැවත ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර පවත්වාගෙන යනු ලැබේ.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2017 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම විගණනයේ විෂය පථය හා සීමාකිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

- තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයට හා අනුකූලවන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

--------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

-----------------------------------

ප්‍රමිතයේ 63 ඡේදය ප්‍රකාරව ආයතනයේ නිශ්චිත සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන් වෙන්ව හඳුනාගත යුතු වුවද , එසේ සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

-----------------------------------

(i) ප්‍රමිතයේ 08 වන ඡේදය ප්‍රකාරව, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත වූ සහ ආයතනය කල්පිරීම තෙක් තබා ගැනීමට අපේක්ෂාවන් ඇති හා කල්පිරීම තෙක් තබාගැනීමට හැකියාව ඇති මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ගැනෙන මූල්‍ය

වත්කම් ලෙස වර්ගීකරණ කළ යුතු වුවත් රු. 3,844,988,912 ක් වූ වත්කම් අනෙකුත් මූල්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණය කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 46(ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 532,548,539 ක්වූ පරිණතවන තෙක් තබා ගන්නා ආයෝජන සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මැනිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 31 දිනට ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම රු.12,632,701 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඒ අනුව ගෙවිය යුතු ආදායම් බදු මුදල ද රු.3,537,156 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කිරීමේ දී මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ආදායම් තුළ ඇතුළත් රු.7,498,445 ක් වන බංගලා ගාස්තු, කුලී ආදායම්, ප්‍රවාහන මගින් ඉපයූ ආදායම් සහ පොහොර උර විකුණුම් ආදායම් යනාදිය සැළකිල්ලට නොගැනීම නිසා ආසන්න වශයෙන් බදු වටිනාකම රු.130,724 ක් අඩුවෙන් තක්සේරු කර තිබුණි.

### 2.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාගමේ සමාලෝචිත වර්ෂයට අදාල ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් පිරිවැටුම රු.253,056,860 ක් වුවත් ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව අනුව එය රු.249,439,632 ක් ලෙස දක්වා තිබීම නිසා රු.3,617,228 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වසර 10 සිට වසර 20 දක්වා කාල පරාසයක් තුළ ආයතන 4 කින් සමාගමට අයවිය යුතු රු. 87,474,958 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි.

### 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) 131 (1) වගන්තිය | 2017 සැප්තැම්බර් 30 දින වන විටත් 2014/2015 වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 223 වගන්තිය | 2015 මැයි 05 දිනට පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්වීම් 2017 සැප්තැම්බර් 15 දින වනවිටත් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය
------------------------------

| | |
|---|---|
| 2.8.1 , 2.8.5 ,4.3.1 , 4.3.2, 5.4.8 , 7.9.2 වගන්ති | අංක හතර ගබඩාවේ වහලය අලුත්වැඩියා කිරීම සඳහා වූ වටිනාකම රු.1,992,175 ක් වූ කොන්ත්‍රාත්තුවේ ලංසු ඇගයීම සඳහා විස්තරාත්මක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකටද එළඹ නොතිබුණි. තවද ඒ වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂණයක්ද ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) අංක පීඑෆ්/පීඊ/21 හා 2002 මැයි.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය
------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 139,592,032 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 603,272,829 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.463,680,797 කින් පිරිහී තිබුණි. මූල්‍ය ආදායම රු.164,008,366 කින් වැඩිවී තිබුණ ද පරිපාලන වියදම රු.94,368,978 කින් හා දළ ලාභය රු. 866,422,146 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 වර්ෂයේ රු.126,856,580 ක් පැවති ශුද්ධ ලාභය 2015/2016 වර්ෂය අවසානයට රු.603,272,829 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එහෙත් පොහොර සහනාධාර ක්‍රමය ඉවත්කිරීමත් සමග සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු.139,592,032 ක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, දේපළ පිරියත හා උපකරණ ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමෙන් පසු 2012/2013 වර්ෂයේ රු.428,414,541 ක් වූ සමාගමේ දායකත්වය 2016/2017 වර්ෂය අවසානයට රු. 476,433,758 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
----------------

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, ශ්‍රී ලංකා කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ ආදායම් හා ලාභදායීත්වය වැඩිකිරීම සඳහා බහුවිධ වෙළඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීමේ මෙහෙවර යටතේ සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපනය කර තිබුණි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී වගාව ප්‍රධාන බෝගයක් වීම නිසා රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස 2006 වර්ෂයේ සිට 2016 පෙබරවාරි 28 දින දක්වා පොහොර මිටියක් රු.350 ක සහනදායී මිලකට

ගොවියාට මිලදී ගැනීමට අවස්ථාව සලසා දී තිබුණු අතර එම සහනාධාර වැඩසටහන සඳහා අවශ්‍ය සියයට 65 ක පොහොර අවශ්‍යතාවය සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් ඉටු කර තිබුණි.
යූරියා, එම්ඕපී, ටීඑස්පී යනාදී සෘජු පොහොර වර්ග හා මිශ්‍ර පොහොරවලින් රු.බිලියන 12.197 ක් ආදායමක් ලබාගැනීමට ඉලක්ක කර තිබුණද 2016 මාර්තු 01 සිට පොහොර සහනාධාර වැඩසටහන ඉවත්කිරීම හේතුවෙන් තත්‍ය අලෙවි ආදායම රු.බිලියන 2.371 ක් විය. ඒ අනුව, ලඟාකර ගත හැකිවූ අලෙවි ආදායම සියයට 19.44 ක් වූ අවම මට්ටමක පැවතුණි.

## 4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පොහොර සාම්පල් පරීක්ෂා කිරීමේ අරමුණින් රු.17,617,653 ක් වටිනා රසායනාගාර උපකරණ හා වෙනත් උපකරණ වලින් සමන්විත වර්ග අඩි 3000 ක පමණ අංග සම්පූර්ණ රසායනාගාරයක් පිහිටුවා තිබුණු අතර රසායනාගාර කළමණාකාරවරියක යටතේ රසායනාගාර සහායකයින් 04 දෙනෙකු හා සාම්පල් එකතු කරන්නෙකු සේවයේ යොදවා තිබුණි. එසේ වුවද, පොහොර ලේකම් කාර්යාලය විසින් සිදුකරනු ලබන පොහොර සාම්පල් තත්ත්ව පරීක්ෂණ කිසිවක් මෙම රසායනාගාරය මගින් සිදුකර නොතිබීම නිසා මෙම වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.

## 4.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සිදුවී තිබූ පොහොර තොග ඌනතාවයන් සම්බන්ධයෙන් අලෙවි නියෝජිතවරුන් හතර දෙනෙකුට එරෙහිව එකතුව රු.268,335,298 ක වන්දි ඉල්ලා නඩු පවරා තිබුණි.

## 4.4 කළමනාකරණ ක්‍රියාකාරකම්

2015 වර්ෂයේ පොතුවිල් ප්‍රාදේශීය පොහොර ගබඩාවේ හිටපු තොග නිලධාරී විසින් සිදුකර තිබූ පොහොර මෙට්‍රික් ටොන් 281 ක තොග ඌනතාවය හේතුවෙන් සිදුවී තිබූ රු.15,269,218 ක පාඩුව අයකර ගැනීම සඳහා 2017 දෙසැම්බර් 05 වන විට නඩු පැවරීම පමණක් සිදුකර තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරණය හා විකුණුම් ප්‍රවර්ධනය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබා දීම සහ ප්‍රජා සත්කාර සේවාවන් සඳහා රු.15,409,813 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජුලි 29 වන දින මීගමුව කුරණ ග්‍රෑන්ඩියා හෝටලයේ පවත්වා තිබුණු අලෙවි නියෝජිත හමුව හා කාබනික පොහොර නිෂ්පාදනය එළිදැක්වීමේ වැඩසටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ රු.5,000,000 ක්වූ වියදම් සීමාව ඉක්මවා රු.2,749,129 ක් වැයකර කර තිබුණි.

තවද වැඩසටහනේ සංවිධාන කටයුතු සිදුකර ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, ආයතන තුනකින් මිල ගණන් කැඳවා තිබුණද එම ආයතන තුනම එකම ආයතනයක් යටතේ ඇති අනුබද්ධිත ආයතන බව විගණනයේදී තහවුරු විය. එසේම උත්සව සංවිධාන කටයුතු සඳහා දරන ලද වියදමින් රු. 3,232,500 ක් එනම් සියයට 43 ක ප්‍රමාණයක් සභාපති හා ක්‍රියාකාරි අධ්‍යක්ෂගේ උපදෙස් මත වැයකර තිබුණි.

(ආ) ආයතනයේ අරමුණින් බැහැරව සමාලෝචිත වර්ෂයේදී නාට්‍ය, ප්‍රසංග, පෙරහැරවල් හා පාසල් සඳහා අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්ක වල බක්මහ උළෙල 97 ක් සඳහා රු.2,813,140 ක් ද සුහද හමු 11 ක් සඳහා රු.513,505 ක් ද දීප ව්‍යාප්ත කෘෂිකර්ම සතිය සඳහා සමාරම්භක දිනයේදී ඉටිපන්දම් 2000 ක් දල්වා කලා වැවේ පා කර යැවීම වෙනුවෙන් රු.390,000 ක් ද හා උපන් දින සුභපැතුම් සඳහා රු.480,000 ක්ද වැය කර තිබුණි.

**4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

සමාගම විසින් 2015 ජනවාරි සිට 2016 පෙබරවාරි දක්වා ආනයනය කර තිබූ පොහොර මෙට්‍රික් ටොන් 365,359 ක් කොළඹ වරායේ සිට කිලෝමීටර් 10 ක් ඇතුළත ගබඩා වෙත ප්‍රවාහනය කිරීම වෙනුවෙන් හිඟ ප්‍රවාහන ගාස්තු ලෙස රු.35,848,212 ක් ගෙවීමට තීරණය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රවාහන සේවා ලබාගැනීම සඳහා තෝරාගන්නා ලද ආයතනය සමග මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීම සඳහා රු.735 ක් ගෙවීමට ගිවිසුම්ගත වී තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින දක්වා එම ගිවිසුම් දීර්ඝ කර තිබුණි. 2015 ජනවාරි 22 දින සිදු වූ ඩීසල් මිල අඩුවීම පදනම් කරගෙන 2015 අප්‍රේල් 30 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2015 මාර්තු 25 දින සිට 2016 අප්‍රේල් 29 දින දක්වා කාල සීමාව තුළ මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීම සඳහා රු.629.16 ක් බැගින් ගෙවීම් කර තිබුණි.

(ii) අදාළ ප්‍රවාහන ආයතනය මෙම මිල අඩුකර ගෙවීම සම්බන්ධයෙන් 2016 පෙබරවාරි 23 දින දක්වාම විරෝධතාවයක් ඉදිරිපත් කර නොතිබුණු අතර පළමු වරට 2016 පෙබරවාරි 24 දින මිල අඩුකිරීමට එකඟ නොවන බව සඳහන් කර රු.35,848,212 ක හිඟ මුදල ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

(iii) 2015 ජූනි 16 දින විවෘත කරන ලද ලංසුව සඳහා ඉහත ප්‍රවාහන ආයතනය පොහොර මෙට්‍රික් ටොන් එකක් ප්‍රවාහනය කිරීම සඳහා රු.635 ක මිලක් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් එම හිඟ මුදල ගෙවීමට තීරණය කිරීම පදනම් විරහිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.7 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ තාර දැමීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුමකට එළඹ බැංකු බැඳුම්කරයක් මත රු.8,859,708 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් 2014 පෙබරවාරි මාසයේ ගෙවා තිබුණි. 2014 මැයි 11 දින කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබීම හේතුවෙන් කාර්යසාධන බැඳුම්කරයේ වටිනාකම වූ රු.2,214,927 ක් අයකරගෙන තිබුණි. එහෙත් විගණන දිනය වූ 2017 ඔක්තෝබර් 30 විගණන දින වන විටත් ගෙවීම් කරන ලද අත්තිකාරම් රු.6,644,781 ක් අයකර ගැනීම සඳහා බේරුම්කරණ නඩුවක් (Arbitration) අධිකරණයක විභාග වෙමින් පැවතුණි.

(ආ) සමාගම විසින් රු.27,188,304 ක වියදමින් නුවරඑළිය බුළුඇල ක්‍රියාත්මක කර තිබූ සංචාරක බංගලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංචාරක බංගලාව ඉදිකිරීමට පෙර ඉඩමේ අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.

(ii) ඉහත කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් උපදේශක සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් තෝරා ගෙන තිබුණි. ඉදිකිරීම්වලට අදාළ ප්‍රමාණපත්‍ර සැකසීමේදී සම්මත මිල අනුපාතයන් යොදා නොගැනීම හේතුවෙන් සමස්ත කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු වටිනාකමෙහි රු.576,728 ක විචලනයක් නිරීක්ෂණය විය.

(iii) කොන්ත්‍රාත්තුව ආරම්භ කර දින 180 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද ඉදිකිරීම් නිම කිරීම දින 136 කින් ප්‍රමාද වී තිබුණු අතර මෙම ප්‍රමාදය සඳහා රු.1,762,016 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(iv) 2017 ඔක්තෝබර් 25,26 හා 27 දිනයන්හි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ඉදිකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ❖ පස් පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව අත්තිවාරම් හා කුළුණු ඉදිකිරීම, සිදුකර තිබීම හා නිසි ප්‍රමිතියකින් තොරවීම නිසා මුළු ගොඩනැගිල්ලේ සියළුම බිත්ති පසාරු වන ආකාරයට පුපුරා ගොස් තිබුණි. තවද Slab, Beam,ග්‍රැනයිට් වර්ක් ටොප් වෙන් වී යන ආකාරයට පුපුරා ගොස් තිබුණි.

- ❖ සියළුම දොරවල් ජනෙල් හා Flashing හා වඩිම්බු සපයා සවි කිරීම සඳහා රු.2,542,000 ක් වැයකර තිබුණ ද ඒවා නිසි ප්‍රමිතියකින් තොර වීම.

- ❖ වහල ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව Lump Sump ක්‍රමයට අනුව ප්‍රදානය කර තිබීම හේතුවෙන් රු.464,900 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

- ❖ ගෙබිම සඳහා රු.959,500 ක් වැයකර නිමකරන ලද වර්ගමීටර් 100 ක කුඹුක් ලෑලි තට්ටුවක් ගැලවී ගොස් තිබුණු අතර රු.3,081,568 ක වියදමකින් ඉදිකළ ගල්බැම්ම හා තාප්පයද නිසි ප්‍රමිතියට ඉදිකර නොතිබීම නිසා බොහෝ ස්ථාන වලින් පුපුරා වෙන් වී ගොස් තිබුණි.

(v) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිමකර වසරකුත් මාස 04 ක කාලයක් ප්‍රමාද වී එය භාවිතයට ගෙන තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රාථමික මට්ටමේ (Skilled) අනුමත කාර්ය මණ්ඩලය 163 දෙනෙකු වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 184 දෙනෙකු වූයෙන් නිලධාරීන් 21 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි.

(ආ) 2016 ජුනි 01 දින කොන්ත්‍රාත් පදනම යටතේ ගබඩා සහායකයින් ලෙස නිලධාරීන් 5 දෙනෙකු සේවයට බඳවාගෙන තිබූ අතර එයින් නිලධාරීන් හතර දෙනෙකු අනුරාධපුර දිස්ත්‍රික්කයේ අමාත්‍ය කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන සෝයා ව්‍යාපෘතියක හා එක් නිලධාරියෙකු සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යාල කාර්ය සහායක ලෙස සේවයේ යොදවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ඔවුන්ගේ වැටුප් වෙනුවෙන් පිළිවෙලින් රු.425,333 ක් හා රු.350,578 ක් වැයකර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015/2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2017 ඔක්තෝබර් 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයිතම 113 ක අයවැයගත හා තත්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 99 සිට සියයට 281 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | සේවක බඳවාගැනීම් විධිමත් පරිදි සිදුනොකිරීම. |
| (ආ) කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම. |
| (ඇ) වත්කම් පාලනය | ඌන උපයෝජිතව පවතින වත්කම් උපයෝජනය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඈ) අයවැය පාලනය | අයවැය ලේඛනය තාත්විකව පිළියෙල නොකිරීම. |
| (ඉ) පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම | සමාගම් පනත අනුව හා ගිණුම් කටයුතු වෙනුවෙන් පවත්වාගත යුතු පොත්පත් හා ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම. |